# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.27 පැය 1540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/856/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**“කාන්තා හා ළමා අපයෝජන, ළමා අපචාර වැලැක්වීම” අරමුණු කරගෙන පොලිස් නිලධරයන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන සම්බන්ධව.**

“කාන්තා හා ළමා අපයෝජන, ළමා අපචාර වැලැක්වීම” අරමුණු කරගෙන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය, එක්සත් ජාතීන්ගේ සංවධර්න වැඩසටහනෙහි (UNDP) ආධාර යටතේ ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කායර්ංශයේ නිලධරයන් උදෙසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රවන්ඩත්වයට අදාලව පැවැත්වීමට නියමිත පුහුණු පාඨමාලා වන්හි විෂය නිදෙර්ශය සකස් කිරීමේ වැඩසටහන 2025.04.25, 26 හා 27 වන තෙදින පුරාවට මීගමුව ජෙට්වින් හෝටල් පරිශ්‍රයේදී පවත්වන ලදී.

ඒ අනුව දිවයින පුරා පිහිටි පොලිස් ළමා හා කාන්තා කායර්ංශ වලට අනුයුක්ත නිලධරයින් 2250ට ආසන්න ප්‍රමාණයකට හා අළුතින් මෙම කායර්ංශයට එක් වූ කණිෂ්ඨ හා පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීමට නියමිත අතර එය දින පහක් සති 03 හා ඩිප්ලෝමා වශයෙන් පාඨමාලා 03ක් වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රවන්ඩත්වය වැලැක්වීමේ කායර්ය සඳහා නිලධරයන්ගේ දැනුම, කුසලතාවය හා ප්‍රවීණතාවය වැඩිදියුණු කිරීම සඳහා වන මූලික විෂය නිදෙර්ශය හඳුනා ගැනීම මෙම වැඩමුළුවේ අරමුණ වේ.

මේ යටතේ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රවන්ඩත්වය වැලැක්වීමේ කායර් සඳහා නීතිපති දෙපාතර්මේන්තුව, ජයවධර්නපුර හා කැළණිය විශ්ව විද්‍යාල, වින්දිතයින් ආරක්ෂා කිරීමේ අධිකාරිය, ළමාරක්ෂක අධිකාරිය, ළමාරක්ෂක බලකාය, පවුල් සෞඛ්‍ය කායර්ංශය, පරිවාස දෙපාතර්මේන්තුව යනාදී රාජ්‍ය අයතන හා සිවිල් සංවිධානවල එකමුතුවෙන් මෙම පුහුණු වැඩසටහන පවත්වන ලදී.

මෙහි නිළ සමාරම්භක වැඩසටහන 2025.04.26 වන දින පැවැත්වූ අතර එම අවස්ථාව සඳහා කැළණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචායර් විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී අනුරුද්ධි එදිරිසිංහ, ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ විධායක අධ්‍යක්ෂ නියොජ්‍ය පොලිස්පති ජාලිය සේනාරත්න, ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කායර්ංශ දිසාව භාර නියොජ්‍ය පොලිස්පති රේනුකා ජයසුන්දර, ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත චන්ද්‍රසේකර, නියොජ්‍ය අධ්‍යක්ෂ, පොලිස් අධ්‍යයන පුහුණු සහකාර පොලිස් අධිකාරී නාමලී හේරත් යන මහත්ම මහත්මීන් ඇතුළු ළමා හා කාන්තා කායර්ංශ නිලධරයන් පිරිසක්ද සහභාගි විය.

මෙම සමාරම්භක අවස්ථාවට අදාල ඡායාරූප







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**